| | |
|---|---|
| මගේ අංකය: | දිනය: |
| DAPH/AD/25/5/17 | 2020.09.05 |

අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය/සත්ත්ව අභිජනන/පශු පර්යේෂණ/මානව සම්පත් සංවර්ධන/සැලසුම් හා ආර්ථික/පශු අණපනත් හා නීති )

**<u>ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු - 2021</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/04-04/01/2014 හා 2016.10.20 දිනැති ලිපියෙන් අනුමත කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I/II/III ශ්‍රේණිවල පශු සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පරිපාටිය අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I/II/III ශ්‍රේණිවල පශු සම්පත් සංවර්ධන නිලධාරීන්ගෙන් 2021 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව ඔබ අංශය යටතේ ඇති සියලුම සේවා ස්ථාන වලට අනුයුක්ත ශ්‍රී තාක්ෂණ සේවයේ I/II/III ශ්‍රේණිවල, පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පශු සම්පත් සංවර්ධන නිලධාරීන්ගෙන් ස්ථාන මාරුවීම් අයදුම්පත් ආකෘති අංක 01 මගින් ලබාගෙන එම ස්ථාන මාරු පිළිබඳ ඔබගේ නිර්දේශ සඳහන් කර උපලේඛනයක් සකසා **2020.09.25** දිනට පෙර මා වෙත ලැබෙන්නට සලස්වන මෙන් කාරුණිකව දන්වමි.

2020.12.31 දින වන විට

- ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයක (C) අවම වසර තුනක සේවාවක් කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම්කළ හැකි වේ.
- ප්‍රිය මනාප සේවා ස්ථානයක (B) අවම වසර හතරක සේවාවක් කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම්කළ හැකි වේ.
- සාමාන්‍ය සේවා ස්ථානයක (A) අවම වසර පහක සේවාවක් කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම්කළ හැකි වේ.
- ඕනෑම සේවා ස්ථානයක වසර 05 ක කාලයක් සේවය කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරුවකට අනිවාර්යෙන්ම යටත් වේ.

නිලධාරියෙකු යම් සේවා ස්ථානයක වසර 10 ක සේවා කාලයක් සේවයේ නිරතව සිටීනම්, ප්‍රිය මනාප හා ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයන්හි සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරීන්ට ස්ථාන මාරු ලබා දීමට හැකි වන පරිදි, ඔහුගේ කැමැත්ත නොමැතිවද ස්ථාන මාරුවීමක් ලැබීමට යටත් විය යුතුය.

03. වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් නොකරන ප්‍රියමනාප සේවා ස්ථානයන්හි වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් තමන් ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ වුවද යාමට අපේක්ෂිත සේවා ස්ථාන සඳහන් කර ආකෘති අංක 02 අනුව තොරතුරු එම නිලධාරීන් වෙතින් ලබාගෙන අංශ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව නියමිත දිනට පෙර මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

04. මෙම ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේදී උපයෝගී කොට ගන්නා ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/7/4/2/2012 හා 2017.06.28 දිනැති ලිපියෙන් අනුමත කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1/11/111 ශ්‍රේණිවල පශු සම්පත් සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටියේ පිටපතක් හා සේවා ස්ථාන වර්ගීකරණයේ පිටපතක් හා අංක 01, 02, 03 දරණ ආකෘති පත්‍රවල පිටපත් මෙම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන WWW.daph.gov.lk වන වෙබ් අඩවියෙන් බාගත හැක.

05. මේ සම්බන්ධයෙන් ඔබගේ අධීක්ෂණය යටතේ සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1/11/111 ශ්‍රේණිවල සියලුම පශු සම්පත් සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

06. 2021 වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට යෝජිත කාල සටහන පහත පරිදි වේ.

(අ) ස්ථාන මාරුවීම් ඉල්ලීම් භාරගන්නා අවසාන දිනය: 2020.09.25

(ආ) වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු දිනය: 2020.10.20

(ඇ) ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම: 2020.10.30

(ඈ) ස්ථාන මාරුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ යුතු අවසන් දිනය: 2020.11.16

(ඉ) වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කළ යුතු දිනය : 2020.12.30

(ඊ) වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක දිනය : 2021.02.01

07. ඒ අනුව ඉහත 02 හා 03 ඡේදවල සඳහන් තොරතුරු, අංක 01 හා 02 ආකෘති පත්‍ර අනුව සම්පූර්ණ කර ඔබගේ නිර්දේශ සහිතව **2020.09.25** දිනට ප්‍රථම මා වෙත ඉදිරිපත් කරන්නේ නම් මැනවි.

වෛද්‍ය ආර්.හෙට්ටිආරච්චි

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කා.දැ.ගැ.ස.
2. ලේකම්, පශු සම්පත් ,ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත ආශ්‍රිත රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
3. සියලුම, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කා.දැ.ගැ.ස.
4. ගරු ලේකම්, පශු සම්පත් සංවර්ධන නිලධාරීන්ගේ සංගමය - කා.දැ.ගැ.ස.

111

මගේ අංකය:

DAPH/AD/25/6/11

දිනය:

2020.09.05

අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය/සත්ත්ව අභිජනන/පශු පර්යේෂණ/මානව සම්පත් සංවර්ධන/සැලසුම් හා ආර්ථික/පශු අණපනත් හා නීති )

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පර්යේෂණ සහකාර 1/11/11 l ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු - 2021**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/7/4/2/2012 හා 2017.06.28 දිනැති ලිපියෙන් අනුමත කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1/11/111 ශ්‍රේණිවල පර්යේෂණ සහකාර නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පරිපාටිය අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1/11/111 ශ්‍රේණිවල පර්යේෂණ සහකාර නිලධාරින්ගෙන් 2021 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව ඔබ අංශය යටතේ ඇති සියලුම සේවා ස්ථාන වලට අනුයුක්ත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1/11/111 ශ්‍රේණිවල පර්යේෂණ සහකාර පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරින්ගෙන් ස්ථාන මාරුවීම් අයදුම්පත් ආකෘති අංක 1 මගින් ලබාගෙන එම ස්ථාන මාරු පිළිබඳ ඔබගේ නිර්දේශ සඳහන් කර උපලේඛනයක් සකසා **2020.09.25** දිනට පෙර මා වෙත ලැබෙන්නට සලස්වන මෙන් කාරුණිකව දන්වමි.

2020.12.31 දින වන විට

- ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයක (C) අවම වසර තුනක සේවාවක් කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම්කළ හැකිවේ.
- ප්‍රිය මනාප සේවා ස්ථානයක (B) අවම වසර හතරක සේවාවක් කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම්කළ හැකිවේ.
- සාමාන්‍ය සේවා ස්ථානයක (A) අවම වසර පහක සේවාවක් කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම්කළ හැකිවේ.
- ඕනෑම සේවා ස්ථානයක වසර 05 ක කාලයක් සේවය කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරුවකට අනිවාර්යයෙන්ම යටත් වේ.

නිලධාරියෙකු යම් සේවා ස්ථානයක වසර 10 ක සේවා කාලයක් සේවයේ නිරතව සිටීනම්, ප්‍රිය මනාප හා ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයන්හි සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරීන්ට ස්ථාන මාරු ලබා දීමට හැකි වන පරිදි, ඔහුගේ කැමැත්ත නොමැතිවද ස්ථාන මාරුවක් ලැබීමට යටත් විය යුතුය.

03. වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් නොකරන ප්‍රියමනාප සේවා ස්ථානයන්හි වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් තමන් ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ වුවද යාමට අපේක්ෂිත සේවා ස්ථාන සඳහන් කර ආකෘති අංක 02 අනුව තොරතුරු එම නිලධාරින් වෙතින් ලබාගෙන අංශ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව නියමිත දිනට පෙර මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

04. මෙම ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේදී උපයෝගී කොට ගන්නා ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/7/4/2/2012 හා 2017.06.28 දිනැති ලිපියෙන් අනුමත කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I/II/III ශ්‍රේණිවල පර්යේෂණ සහකාර නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටියේ පිටපතක් හා සේවා ස්ථාන වර්ගීකරණයේ පිටපතක් හා අංක 01, 02, 03 දරණ ආකෘති පත්‍රවල පිටපත් මෙම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන WWW.daph.gov.lk වන වෙබ් අඩවියෙන් බාගත හැක.

05. මේ සම්බන්ධයෙන් ඔබගේ අධීක්ෂණය යටතේ සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I/II/III ශ්‍රේණිවල පර්යේෂණ සහකාර සියලුම නිලධාරින් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

06. 2021 වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට යෝජිත කාල සටහන පහත පරිදි විය යුතු බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

(අ) ස්ථාන මාරුවීම් ඉල්ලීම් භාරගන්නා අවසාන දිනය: 2020.09.25
(ආ) වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු දිනය: 2020.10.20
(ඇ) ස්ථාන මාරු නියෝග නිකුත් කිරිම: 2020.10.30
(ඈ) ස්ථාන මාරුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ යුතු අවසන් දිනය: 2020.11.16
(ඉ) වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කළ යුතු දිනය : 2020.12.30
(ඊ) වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක දිනය : 2021.02.01

වෛද්‍ය ආර්.හෙට්ටිආරච්චි
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කා.දැ.ගැ.ස.
2. ලේකම්, පශු සම්පත් ,ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත ආශ්‍රිත රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
3. සියලුම, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කා.දැ.ගැ.ස.
4. ගරු ලේකම්, පර්යේෂණ සහකාරවරුන්ගේ සංගමය - කා.දැ.ගැ.ස.